"සම්භාහන මධ්‍යස්ථානයක් වටලයි" යනුවෙන් වන සිරස්තලයක් සමගින් දිනමිණ පුවත්පතේ පළ වූ පුවත් වාර්තාවක, උපසිරස්තලය වූයේ "මුස්ලිම් කතකුත් ඒ අතරේ" යන්නයි. එසේම පුවත් අන්තර්ගතය තුළද එම සම්භාහන මධ්‍යස්ථානයේ සිටි කාන්තාවන් අතර මුස්ලිම් කාන්තාවක් සිටි බව සඳහන්ව තිබිණි.

පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය හෝ ආගමිකත්වය පුවතකට සෘජුව අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළැකිය යුතු බව ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ප්‍රකාශිත වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ දැක්වේ. එසේ නම් මෙම පුවතේදී සම්භාහන මධ්‍යස්ථානයේ සිටි එක් කාන්තාවක් 'මුස්ලිම්' බව විශේෂයෙන් සඳහන් කිරීමට ඇති පදනම කුමක්දැයි ඇසීමට සිදුවේ. සම්භාහන මධ්‍යස්ථානයේ සිටි බව කියවෙන අනෙකුත් කාන්තාවන්ගේ වාර්ගිකත්වය සඳහන් කෙරී නැති බවද මෙහිදී පෙන්වා දිය යුතු වේ. ඒ අනුව බලනා විට, වාර්ගිකත්වය අදාළ නොවන අවස්ථාවක, වාර්ගිකත්වයක් ඉස්මතු කොට දැක්වීම ඔස්සේ දිනමිණ පුවත් වාර්තාව මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය කොට තිබෙනා බවද කීමට සිදුවේ.

**#MediaEthicsSL #lka #SinhalaPress #Dinamina**
See Less